# ක්‍රියාකාරකම් පත්‍රිකා

# 10 ශ්‍රේණිය

# ඉතිහාසය



## ඒකකය 2

## ශ්‍රී ලංකාව ජනාවාස වීම -02







## පූර්ව ඓතිහාසික යුගය

අයි.එම්.ධම්මික කුමාර ඉලංකෝන් (ගුරු උපදේශක)
කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය, කුරුණෑගල

# පූර්ව ඓතිහාසික යුගය

1.ඉතිහාසය පෙළ පොත හා මෙම පාඩමට අදාළ කියවීම් පත්‍රිකාව හොඳින් කියවා පහත සඳහන් ක්‍රියාකාරකම් වල නිරත වන්න. නිවැරදි පිළිතුරට යටින් ඉරක් අඳින්න.

01. ශ්‍රී ලංකාවේ යකඩ භාවිතය පිළිබඳව මුල්වරට පැහැදිලි පුරාවිද්‍යාත්මක සාධක හමු වන්නේ,

1. ප්‍රාග් ඓතිහාසික යුගයේ දීය. 2. පූර්ව ඓතිහාසික යුගයේ දීය.
3. මුල් ඓතිහාසික යුගයේ දීය. 4. ඓතිහාසික යුගයේ දීය.

02. දඩයමින් ජීවත් වූ ප්‍රාග් ඓතිහාසික මානවයා, ගොවිතැන කෙරෙහි යොමු වීමට බලපෑ මූලික පරිසරාත්මක හේතුව මින් කුමක්ද?

1. පසෙහි සාරවත් බව වැඩිවීම.
2. දඩයමට සුදුසු සතුන් හිඟවීම.
3. පැවති ශීත දේශගුණය වෙනස් වී උණුසුම් දේශගුණයක් ඇරඹීම.
4. ජන සංඛ්‍යාව වැඩිවීම හා ව්‍යාප්ත වීම.

03. දඩයම් යුගය අවසානයේ ස්ථිර ජනාවාස හා වාසස්ථාන ගොඩනගාගත් බවට පැහැදිලි නිවාස අවශේෂ සොයා ගෙන ඇති ගම්මානය වන්නේ මින් කුමක් ද?

1. ඉබ්බන්කටුව 2. උඩරංචාමඩම 3. පාහියන්ගල 4. සීගිරියේ පොතාන

04.ශ්‍රී ලංකාවේ පූර්ව ඓතිහාසික යුගය සම්බන්ධයෙන් පැරණිතම තොරතුරු ලැබෙන ස්ථානයකි.

1. පාහියංගල 2. ඉබ්බන්කටුව 3. බෙරගල 4. කළඹටුවාව

05. ලෝකය තුළ කෘෂිකර්මාන්තයට උචිත පරිසරයක් ගොඩනැගුන යුගය කුමක් ද?

1.මෙගලිතික යුගය 2.පැලියෝලිතික යුගය
3. ප්ලයිස්ටොසීන යුගය 4. හොලෝසීන යුගය

06. ශ්‍රී ලංකාවේ පූර්ව ඓතිහාසික යුගය පිළිබඳ පැහැදිලි සාධක බහුලවම හමුවන ප්‍රදේශය වන්නේ

1. සපරගමු පළාතේ ඊසාන දිග කොටසින් හා ඌව පළාතේ නිරිත දිග කොටසින් ය.
2. ඌව පළාතේ ඊසාන දිග කොටසින් හා සබරගමු පළාතේ නිරිත දිග කොටසින් ය.
3. උතුරුමැද පළාතේ දකුණු කොටසින් හා වයඹ පළාතේ ඊශානදිග කොටසින් ය.
4.නැගෙනහිර පළාතේ බටහිර දෙසින් හා සබරගමු පළාතේ ඊශානදිග කොටසින් ය.

**07.** යාපහුව ගල් සොහොන්කනත්ත අයත් වන්නේ කුමන සුසාන වර්ගයකට ද?

**1.** මැටි ඔරු **2.** විස්කෘත **3.** ශිලා මංජුසා **4.** හරණී

**08.** මහා ශිලා සුසාන සම්ප්‍රධායට අයත් පැරණිතම සුසාන ක්‍රමය කුමක් ද?

**1.** මැටි ඔරු **2.** විස්කෘත **3.** ශිලා මංජුසා **4.** හරණී

## ● ඡායාරූප ඇසුරෙන් අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

**01.**



**I.** මෙම ඡායාරූපයෙන් දැක්වෙන සුසාන වර්ගය කුමක්ද?

........................................................

**II.** මෙම සුසාන කුමන සම්ප්‍රධායකට අයත් ද?

........................................................

**III.** මෙවැනි සුසාන දැකිය හැකි ස්ථානයක් නම් කරන්න.

........................................................

**IV.** මෙහි ඇති මැටි බඳුන් වල තැම්පත් කර ඇත්තේ මොනවා ද?

........................................................

**02.**



**I.** මෙම බඳුන හමු වූ ස්ථානය කුමක් ද?

........................................................

**II.** මෙම බඳුන අයත්වන යුගය කුමක් ද?

........................................................

**III.** මෙම මැටි බඳුනේ ඇති විශේෂත්වයක් ලියන්න

........................................................

**IV.** මෙවැනි මැටි බඳුන් පොදුවේ හඳුන්වන නම කුමක් ද ?

........................................................

● පහත සඳහන් ප්‍රශ්නයට පිළිතුරු සපයන්න.

01.

I. **a.** පූර්ව ඓතිහාසික යුගය හැඳින්වීම සඳහා භාවිතා කරන වෙනත් නමක් ලියන්න.

B. ලංකාවේ පූර්ව ඓතිහාසික සම්බන්ධයෙන් පැහැදිලි සාධක හමුවන ප්‍රදේශ දෙකක් නම් කරන්න.

II. පූර්ව ඓතිහාසික යුගය ප්‍රාග් ඓතිහාසික ගල් යුගයෙන් වෙන් කර හඳුනාගත හැකි වෙනස්කම් 04 ක් නම් කරන්න.

III. පූර්ව ඓතිහාසික යුගයේ මානවයාගේ සුසාන ක්‍රම පිළිබඳ උදාහරණ සහිතව විස්තර කරන්න.

IV. පූර්ව ඓතිහාසික යුගයේ මානවයා තාක්ෂණය භාවිතා කළ ආකාරය උදාහරණ සහිතව විස්තර කරන්න.

- පහත සඳහන් ස්ථාන ලංකා සිතියමෙහි ලකුණු කර නම් කරන්න.

උඩරංචාමඩම, ඉබ්බන් කටුව , පොම්පරිප්පු , බෙරගල , හල්දුම්මුල්ල ,යාපහුව ගල්සොහොන් කනත්ත ,යටිගල්පොත්ත

